# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2202/16 - 2020 නොවැම්බර් මස 18 වැනි බදාදා - 2020.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පාර්ලිමේන්තුවට තේරී පත්වීම හේතුකොට ගෙන රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වන වගන්තිය යටතේ තනතුර දරූ සභාපති වන ලොකුහෙලපිටියගේ සුදත් මංජුල අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා නාරංගොඩ රාලලාගේ මංජුල ප්‍රියශාන්ත නවරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, සජිත් වසන්ත වෙල්ගම වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය වූ) 66 ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නාරංගොඩ රාලලාගේ මංජුල ප්‍රියශාන්ත නවරත්න, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**සජිත් වසන්ත වෙල්ගම,**
තේරීම්භාර නිලධාරී,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.


1A - G 33218 — 31 (2020/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*